**අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහන (ඊඑස්ඩීපී) - පළාත් මට්ටම - 2014**

**------------------------------------------------------------------------------------------**

අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහන (ඊඑස්ඩීපී) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2013 අගෝස්තු 19 දින එළඹී අංක 3008 එස්ආර්අයි සාමාන්‍ය මෙහෙයුම් හා අංක 3009 එස්ආර්අයි විශේෂ මෙහෙයුම් ගිවිසුම්වල iv ව්‍යවස්ථාවේ 4.04 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ණය ගිවිසුම්වලට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය (අධ්‍යා.අමා.) හා සියලුම පළාත් සභා විසින් වැඩසටහනේ පළාත් මට්ටමේ කාර්යයන් සිදුකිරීමට බලාපොරොත්තු වේ. සියලුම පළාත් සභා විසින් සිදුකළ කාර්යයන් සම්බන්ධ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ අඩංගුවේ.

## 1.2 <u>ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය</u>

ණය ගිවිසුම්වලට අනුව, රටේ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝග ඇමතීමට 2013-2017 අධ්‍යාපන ක්ෂේත්‍ර සංවර්ධන කාර්යය රාමුවක් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහයෝගය ලබාදීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ද්විතියක පාසල්වල පිරිමි හා කාන්තා උපාධිධාරී සේවා නියුක්තිය ඉහළ නංවන නවීන ද්විතීක පාසල් අධ්‍යාපන ක්‍රමයක් වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 200 ක් වේ. වැඩසටහනේ කාර්යයන් 2013 අගෝස්තු 19 ආරම්භ කරන ලද අතර 2018 අගෝස්තු 31 වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබේ.

## 1.3 <u>ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

අධ්‍යාපන අමාත්‍යාංශයේ හා සියලු පළාත් සභා නවයේ විසර්ජන ගිණුම් සම්පාදිත කිරීමෙන් මෙම ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ

වැරදි හේතුවෙන් ඒකාබද්ධ වැඩසටහනනේ වාර්ෂික මූල්‍ය වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ වැඩසටහනනේ වාර්ෂික මූල්‍ය වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද ප්‍රගති වාර්තා සහ වැඩි දියුණු කරන ලද මූල්‍ය වාර්තා ව්‍යාපෘතියේ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාවේ දැක්වෙන වියදම් සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා දරන ලද වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, මෙහෙයුම් කටයුතුෙවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය මුදලින් මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) මුදල් රෙගුලාසි (මුරෙ) 150 සහ 2014 දෙසැම්බර් 01 දිනැති මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 239/2014 ට අනුකූලව ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ

(ඌ) මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වුයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ ,

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභා නවයේ 2014 වර්ෂයේ විසර්ජන ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ 2014 දෙසැම්බර් 01 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 239/2014 හි සඳහන් විධිවිධානවලට අනුකූල වන පරිදි පිළියෙල කර ඉදිරිපත් කර ඇත. ඉහත විසර්ජන ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා පොත්පත්, පළාත් සභා නවය විසින් පවත්වාගෙන යනු ලැබූ ලේඛන හා වාර්තා සමඟ එකඟ වේ. 2014 වර්ෂය සඳහා ණය සහ ප්‍රදාන මුදල් වලින් දරන ලද පිරිවැය පළාත් සභා නවයේ විසර්ජන ගිණුම්වල නියමිත පරිදි වාර්තා කර තිබුණු බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඇ) මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ණය දෙන නියෝජිතායතනය | 200 | 26,000 | 3,094 | 23.8 | 3,091 | 23.8 | 3,091 |
| | 200 | 26,000 | 3,094 | 23.8 | 3,091 | 23.8 | 3,091 |

## 3.2 භෞතික ප්‍රගතිය

මූල්‍ය ගිවිසුමේ උපලේඛන 03 හි ඇමුණුම් 01 අනුව වියපැහැදම් කිරීම් සම්බන්ධ දර්ශක 33 යටතේ වියපැහැදම් කිරීම් සම්බන්ධ ප්‍රතිඵල 09 ක් ඉටුකර ගැනීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. තවද,පළාත් සභා විසින් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා සියලු අරමුදල් මූලාශ්‍ර වලින් 2014 දෙසැම්බර් 31 දිනට දරන ලද මුළු වියදම වූ රු. මිලියන 94,237 ක් නියෝජනය කරන ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තා 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල මෙහෙයුම්වලට අදාළ 2014 වර්ෂයේ පළාත් සභා විසර්ජන ගිණුම් සම්බන්ධයෙන් කරන ලද ප්‍රධාන විගණන නිරීක්ෂණ කිහිපයක් පහත ආකාරයට නැවත ඉදිරිපත් කෙරේ.

(i) ලැබුණු තොරතුරුවලට අනුව, උතුරු මැද පළාත සඳහා කරන ලද මුළු වෙන්කිරීම වූ රු.5,910,000 ක අගයකින්, සමාලෝචිත වර්ෂය තුළ සියයට 25 සිට සියයට 69 දක්වා වූ පරාසයක ඉතිරිවීම් වාර්තා විය.

(ii) ද්විතියක පාසල් 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ , මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සංවර්ධනය කර ඉදිකිරීමට උතුරු මැද පළාතේ ද්විතීයික පාසල් 83 ක් තෝරා ගෙන තිබුණි. කෙසේ වුවද, 2015 අගෝස්තු 31 දිනට විද්‍යාගාර 10 ක ක්‍රියාකාරකම් පමණක් සිසුන්ගේ භාවිතය සඳහා විවෘත කර තිබුණි. අත්‍යාවශ්‍ය උපකරණ හා විදුලිබල සම්බන්ධතාවයේ අඩුපාඩු නිසා අනිකුත් පාසල්වල තාක්ෂණික විද්‍යාගාර ක්‍රියාත්මක නොවීය.

(iii) ලබාගත් තොරතුරුවලට අනුව, උතුරු මැද පළාතේ ආරම්භක අවස්ථාවේ පෝෂක පාසල් වැඩසටහනට ඇතුළත් වූ පාසල් 25 ක් පසුව එම වැඩසටහනින් ඉවත් කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ එම පාසල්වල 6 ශ්‍රේණියේ පංතිවලට ළමුන් ඇතුළත්වීම සමාලෝචිත වර්ෂය තුළ අඩු වී තිබුණි.

(iv) පළාත් මට්ටමේ පාසල් සඳහා ගුරුවරුන් වෙන් කිරීම සතුටුදායක ලෙස සිදුකර නොතිබුණි. ලබාගත් තොරතුරුවලට අනුව, උතුර, උතුරු මැද, වයඹ, සබරගමුව හා බස්නාහිර පළාත්වල දුරස්ථ ප්‍රදේශවල පාසල්වල ප්‍රධාන විෂයයන් සඳහා ගුරු හිඟයක් පැවති අතර එම පළාත්වල නාගරික ප්‍රදේශවල පාසල්වල ගුරු අතිරික්තයක් විය. තවද, වාර්ෂික ගුරු මාරුවීම් ක්‍රමය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබු අතර ඒ හේතුවෙන්, සබරගමුව, උතුරු මැද හා වයඹ පළාත්වල පාසල් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් එකම පාසලේ වසර 10 කට වඩා වැඩි කාලයක් සිට ඇත. ඊට අමතරව, සබරගමුව හා වයඹ පළාත්වල පාසල් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන චක්‍රලේඛ උපදෙස් සුදුසු ලෙස ක්‍රියාත්මක කර නොතිබු අතර එම පාසල්වල ගුරුවරුන් ඌන උපයෝජිතව සිටි බව විස්තරාත්මක විගණනයේදී නිරීක්ෂණය විය.

(v) ලබාගත් තොරතුරුවලට අනුව, පළාත් කිහිපයක ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රාථමික සහ ද්විතීයක පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව අඩු මට්ටමක පැවතුනි. පිළිවෙලින් දකුණු පළාතේ හා මධ්‍යම පළාතේ 500 ට අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින ද්විතීයක මට්ටමේ පාසල් 823ක් හා 1211 ක් තිබූ අතර මධ්‍යම පළාතේ ශිෂ්‍ය සංඛ්‍යාව 100 ට වඩා අඩු ප්‍රාථමික මට්ටමේ පාසල් 564 ක් විය. සබරගමුව පළාතේ ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට වඩා අඩු පාසල් 244 ක් විය. 2014 දෙසැම්බර් 31 දිනට වයඹ පළාතේ පාසල් 126 ක් හා උතුරු පළාතේ පාසල් 88 ක් වසා දමා ඇති බව වාර්තා විය.

(vi) උතුරු පළාතේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වීමේ ශිෂ්‍ය අනුපාතය සියයට 21 ක් වූ අතර අනෙකුත් පළාත්වල සමත්වීමේ ශිෂ්‍ය අනුපාතය සියයට 11 සිට සියයට 17 දක්වා පරාසයක පැවතුනි. ඌව, උතුර හා මධ්‍යම පළාත්වල අ.පො.ස.(සා/පෙ) විභාගයේ සියළු විෂයයන් අසමත් වීමේ අනුපාතය සියයට 4 සිට සියයට 6 දක්වා පරාසයක පැවතුනි. තවද, උතුරුමැද, උතුර හා නැගෙනහිර පළාත්වල අ.පො.ස.(උ/පෙ) විභාගයේ සියළු විෂයයන් අසමත් වීමේ අනුපාතය සියයට 8 සිට සියයට 11 දක්වා ඉහළ පරාසයක පැවතුනි.

(vii) සබරගමුව හා බස්නාහිර පළාත්වල පාසැල්වල සිදුකරන ලද විස්තරාත්මක විගණනයේදී පළාත් මට්ටමේ පාසල්වල, ආධාරක ලියකියවිලි හෝ විධිමත් අධිකාරි බලයක් හා විධිමත්ව පිළියෙල කළ වවුචර් නොමැතිව ගෙවීම් කිරීම් නිරීක්ෂණය විය. තවද, සබරගමුව හා බස්නාහිර පළාත්වල පාසල් 343 ක් විසින් බැංකු ගිණුමේ කාර්තුමය ගිණුම් වාර්තා පිළියෙල කර නොතිබුණි. තවද, මානව සම්පත් කළමනාකරණය, ගුරුවරුන්ගේ නිවාඩු හා ගුණාත්මක යෙදවුම් සඳහා විධිමත් වාර්තා පවත්වාගෙන නොයාම, ශිෂ්‍යයින්ගේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ රජයේ ආධාර බෙදාහැරීම සහ ගුරුවරුන්ගෙන් ආපදා ණය අය නොකිරීම්, ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම යන ක්ෂේත්‍රයන්හි අදාළ පළාත් පාසල්වල සාමාන්‍ය පරිපාලන කටයුතු බස්නාහිර, සබරගමුව, උතුර, උතුරු මැද හා වයඹ පළාත්වල පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල සිදුකරන ලද විස්තරාත්මක විගණනයේදී නිරීක්ෂණය විය. තවද, උතුර, සබරගමුව හා උතුරුමැද පළාත්වල පළාත් අමාත්‍යාංශ විසින් හානි ලේඛන හා වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් නඩත්තු කර නොතිබුණි.

(viii) වයඹ, උතුරු මැද හා සබරගමුව පළාත්වල, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු විසින් වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂයේ පවත්වා නොතිබුණි.